සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජූලි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2022-08-20
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

(a) පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ විවිධ වර්ගයේ ආර්ථික තීරණ ගැනීම සඳහා පරිශීලකයන්ට හැකියාව ලබාදීමයි.

**ඔබ විසින් කළ යුතු දැ:**

පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශන භාවිතයෙන් සමාගමක ඇල්මැති පාර්ශවයන්ට (stakeholders) ගතහැකි තීරණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු, ඒවා තුළින් ලබාදීමට අපේක්ෂා කරන සංසිද්ධිය පිළිබඳව සාධාරණ නියෝජනයක් ලබා නොදීමේ අවදානමට මුහුණ දේ.

**ඔබ විසින් කළ යුතු දැ:**

මූල්‍ය තොරතුරුවල සම්පූර්ණ බව සහ සන්සන්දනාත්මක බව අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **02** වන ප්‍රශ්නය

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** සිය මෙහෙයුම් කටයුතු 2018 වසරේදී ආරම්භ කරන ලද අතර, මෙම සමාගම සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්වයක් ලෙස වර්ගීකරණය කර ඇත. පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් ලබාගැනීම සඳහා සමාගම, **පෙරේරා** නම් මූල්‍ය විශේෂඥයෙකුගෙන් උපදෙස් පතා ඇත.

(a) 2021 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ක්ෂය ක්‍රමය, හීනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්‍රමයට වෙනස්කර ඇත. එම වෙනස්වීම නිසා සමුච්චිත ක්ෂයවීම්වලට ඇතිවන බලපෑම රු. මිලියන 1.2 කි.

(b) සමාගම විසින් රු. මිලියන 31 ක නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර, එය කාලීන ණයක් මගින් මූල්‍යනය කර ඇත. ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කිරීම දක්වා වූ ණය ගැනුම් පිරිවැය (borrowing cost) රු. මිලියන 1.2 ක් විය.

(c) අමුද්‍රව්‍ය අගය කිරීමේ ක්‍රමය, භරිත සාමාන්‍ය ක්‍රමයේ [Weighted Average Method (WAM)] සිට ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු [First-In-First-Out (FIFO)] ක්‍රමයට වෙනස් කිරීමට අපේක්ෂා කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත එක් එක් කරුණ, සුළු හා මධ්‍ය පරිමාණ (SMEs) අස්තිත්වයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතයට (SLFRS) අනුව **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වල සලකා බැලිය යුත්තේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

ව්‍යාපාරයකට සාංගමික වටිනාකමක් නිර්මාණය කිරීමේ සහ තිරසාරබවේ ක්‍රියාවලියක් ලෙස සංකලිත වාර්තාකරණය [Integrated Reporting (IR)] බහුල වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "සංකලිත වාර්තාව" යන පදය **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) සංකලිත වාර්තාවක ප්‍රධාන අන්තර්ගත මූලිකාංග / සංරචක තුනක්(3) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

1995 අංක 15 දරණ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත බලාත්මක වීමෙන් පසුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවීම, නෛතික අවශ්‍යතාවයක් වී ඇති අතර, එය නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සඳහා අදාල වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (Specific Business Enterprises) ලෙස වර්ගීකරණය කර ඇති අස්තිත්ව තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ බලතල දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත මානෙල් (පෞද්ගලික) සමාගමේ** 2022 මාර්තු 31 දිනට සහ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහතින් දී ඇත:

**සීමාසහිත මානෙල් (පෞද්ගලික) සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2022 | 2021 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 7,200 | 6,000 |
| සමුච්චිත ක්ෂය | (4,100) | (3,500) |
| **ධාරණ අගය** | **3,100** | **2,500** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 3,120 | 4,360 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 1,980 | 2,930 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,400 | 860 |
| | **7,500** | **8,150** |
| **මුළු වත්කම්** | **10,600** | **10,650** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 2,000 | 2,000 |
| රඳවාගත් ඉපැයීම් | 2,690 | 2,790 |
| | **4,690** | **4,790** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 2,200 | 2,050 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 1,750 | 1,250 |
| | **3,950** | **3,300** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 210 | 150 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,390 | 2,140 |
| ගෙවිය යුතු පොලී | 150 | 120 |
| ගෙවිය යුතු ආදායම් බදු | 210 | 150 |
| | **1,960** | **2,560** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **10,600** | **10,650** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.145,000/- කි.

(2) රු. මිලියන 1.1 කට මිලටගත් යන්ත්‍රයක් 2021 අප්‍රේල් 01 දින රු. මිලියන 1.5 ක මුදලකට විකුණන ලදී. 2021 අප්‍රේල් 01 දිනට මෙම යන්ත්‍රයේ සමුච්චිත ක්ෂයවීම් රු.500,000/- කි. ප්‍රතිස්ථාපනයක් වශයෙන් 2022 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලට ගෙන ඇත.

(3) වර්ෂය සඳහා වන පොලී වියදම රු.350,000/- ක් වන අතර, වර්ෂය තුළදී රු.900,000/- ක නව ණයක් ලබාගෙන ඇත.

(4) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාරිතෝෂික සඳහා වන වෙන්කිරීම රු.600,000/- කි.

(5) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සාමාන්‍ය කොටස්හිමියන්ට ලාභාංශ ගෙවා නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත මානෙල් (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය යටතේ</u> **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

(A) ගෝලීය වශයෙන් මූල්‍ය වෙළෙඳපොළවල් තුළ ඇතිවූ මෑතකාලීන සංවර්ධනයන් සමඟ මූල්‍ය උපකරණ සංකීර්ණ වෙමින් පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "මූල්‍ය උපකරණ" යන පදය **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) මූල්‍ය වගකීම් යටතේ වර්ගීකරණය කර ඇති අයිතම තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(B) **සීමාසහිත සක්විති (පෞද්ගලික) සමාගම,** නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2021 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර, එහි ඉදිකිරීම 2021 දෙසැම්බර් 31 දින අවසන් කරන ලදී. මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් දරණ ලද මුළු පිරිවැය රු. මිලියන 50 කි. මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය, රු. මිලියන 40 ක ව්‍යාපෘති ණයකින් හා තවත් රු. මිලියන 10 ක කාලීන ණයක් මඟින් පූර්ණ වශයෙන් මූල්‍යනය කර ඇත. මෙම පහසුකම් 2021 අප්‍රේල් 01 දින ලබාගෙන ඇති අතර, මෙම ඉදිකිරීම සඳහා වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම භාවිත කර ඇත. ව්‍යාපෘති ණය හා කාලීන ණය සඳහා වන වාර්ෂික පොළී අනුපාතිකය පිළිවෙලින් 10% ක් හා 9% ක් වේ. මෙයට අමතරව, ව්‍යාපෘති ණය තුළින් ලබාගන්නා ලද ණය මුදල භාවිතකරන තෙක් එම ණය මඟින් ලබාගත් මුදල් මූල්‍ය වෙළෙඳපොළේ උපකරණවල ආයෝජනය කිරීම මඟින් රු. මිලියන 0.5 ක පොළී ආදායමක් මූල්‍ය වර්ෂය තුළදී ලබාගෙන ඇත. 2021/22 වර්ෂය සඳහා සමාගම විසින් ණය සඳහා වන පොළී ගෙවා ඇති අතර, ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම, 2022/23 වර්ෂයේ සිට සිදුකළ යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 (LKAS 23) - ණය ගැනුම් පිරිවැය අනුව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රාග්ධනිත කළ යුතු ණය පොළිය **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Digicell සමාගම,** නවතම ලැප්ටොප් පරිගණක විකිණීමෙහි හා අන්තර්ජාල පහසුකම් සැපයීමෙහි නිරත සන්නිවේදන සමාගමකි. සමාගම, ලැප්ටොප් පරිගණකයක් සහ අන්තර්ජාල පහසුකම් සැපයීම සඳහා මසකට රු.10,000/- ක කුලියකට ගනුදෙනුකරුවෙකු සමඟ වසර දෙකක ගිවිසුමකට 2021 අප්‍රේල් 01 දින එළඹ ඇත.

මෙය වෙන වෙනම විකුණනු ලබන්නේ නම්, ලැප්ටොප් පරිගණකයක වෙළෙඳපොළ මිල රු.100,000/- ක් වන අතර, මාසික අන්තර්ජාල ගාස්තුව රු.7,000/- ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අයභාරය හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 (SLFRS 15) - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් යටතේ අයභාරය අනුව, 2022 මාර්තු 31 දිනෙන් සහ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂවලට අදාලව **සීමාසහිත Digicell සමාගමේ** ගිණුම්කරණ සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) **සීමාසහිත රුසිරු සමාගමේ** ගණකාධිකාරිවරයා විසින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පහත සඳහන් සිදුවීම් සිදුව ඇතැයි හඳුනාගෙන ඇත:

(1) උසස් තාක්ෂණයෙන් සහ නිෂ්පාදන ධාරිතාවයකින් යුක්ත නව යන්ත්‍රයක් ස්ථාපනය කිරීමත් සමඟ නිෂ්පාදන දෙපාර්තමේන්තුව විසින් භාවිත කරනු ලබන යන්ත්‍රයක් නොකඩවා භාවිතයට නොගනී. 2022 මාර්තු 31 දිනට මෙම යන්ත්‍රය රු. මිලියන 7.5 කින් හානිකරණය වී තිබුණි. මෙම හානිකරණ අලාභය **සීමාසහිත රුසිරු සමාගමේ** 2021/22 මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොමැති බවට නිරීක්ෂණය විය.

(2) අළුතින් මිලටගත් මෝටර් රථයක් වෙනුවෙන් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ක්ෂයවීම් ගිණුම්ගත කර නොමැති බවත් එහි වර්ෂය සඳහා වන ක්ෂයවීම් රු.750,000/- ක් වන බවත් ගණකාධිකාරී විසින් තවදුරටත් හඳුනාගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 (LKAS 8) - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි අනුව, ඉහත සිද්ධීන් මඟින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත රුසිරු සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලට ඇතිකරන බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ජැක්සන් පොදු සමාගමේ** පොත්වලින් 2022 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත ජැක්සන් පොදු සමාගම**

**2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 10,000,000) | | 100,000 |
| 2021 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 14,500 |
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ අගය - රු. මිලියන 20) | 38,000 | |
| යන්ත්‍ර | 14,000 | |
| **2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 9,000 |
| යන්ත්‍ර | | 8,000 |
| 2022 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 41,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 37,000 | 17,900 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 7,200 | |
| ස්ථාවර තැන්පතු - මාස 6 කින් කල් පිරෙන | 20,000 | |
| 2022 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වූ ප්‍රතිපාදනය | | 6,200 |
| ඉදිරියට කළ ගෙවීම් | 12,000 | |
| ගෙවූ ආදායම් බදු | 6,100 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 102,800 | 168,000 |
| ලැබූ පොලී ආදායම් | | 2,800 |
| ගෙවූ කල්බදු අත්තිකාරම් | 1,988 | |
| 2021 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 4,300 |
| පරිපාලන වියදම් | 17,700 | |
| බෙදාහැරීමේ වියදම් | 29,912 | |
| මූල්‍ය වියදම් | 3,000 | |
| | **330,700** | **330,700** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.39,400,000/- කි.

(2) 2022 මාර්තු 31 දිනට, ඉඩම, රු.25,000,000/- කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, එය ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(3) 2021 අප්‍රේල් 01 දින මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ නව මෝටර් රථයක් මිලට ගන්නා ලදි. කල්බදු මෝටර් රථයේ සාධාරණ වටිනාකම රු. මිලියන 4ක් වූ අතර, කල්බදු කාල සීමාව වසර 4 කි. වාර්ෂික කල්බදු වාරිකය වන රු.988,000/- ක මුදල සෑම වසරකම මාර්තු 31 දින ගෙවිය යුතුය. ව්‍යංග පොලී අනුපාතිකය (Implicit interest rate) වාර්ෂිකව 12% කි. කල්බදු කාලසීමාව අවසානයේ මෝටර් රථයේ හිමිකාරීත්වය **සීමාසහිත ජැක්සන් පොදු සමාගමට** මාරු වේ. මෝටර් රථය වෙනුවෙන් ගෙවූ මූලික ගෙවීම වන රු. මිලියන 1 ක මුදල සහ පළමු වාරිකය වන රු.988,000/- ක මුදල, ගෙවූ කල්බදු අත්තිකාරම් ගිණුමෙහි සටහන් කර ඇත. මේ හැර ගිණුම් පොත්වල වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(4) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂ 50 |
| යන්ත්‍ර | : | වර්ෂ 05 |
| මෝටර් වාහන | : | වර්ෂ 04 |

(5) 2022 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන රු.400,000/- ක විගණන ගාස්තුව ගිණුම් ගතකර නොමැති අතර, ඉදිරියට කළ ගෙවීම් ගිණුමෙන් නියෝජනය වනුයේ 2022 සම්පූර්ණ වර්ෂයටම සිදුකළ රක්ෂණ ගෙවීමයි.

(6) 2020/21 තක්සේරු වර්ෂය සඳහා වන මුළු ආදායම් බදු වගකීම රු.4,300,000/- ක් වූ අතර, එය 2021/22 තක්සේරු වර්ෂය තුළදී ගෙවා ඇත. එසේ ගෙවූ මුදල ගෙවූ ආදායම් බදු ගිණුමට හර කර ඇත. 2021/22 තක්සේරු වර්ෂය සඳහා වන මුළු ආදායම් බදු වගකීම රු.7,300,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(7) 2021/22 තක්සේරු වර්ෂයේදී ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට එරෙහිව නඩුවක් ගොනුකර ඇත. 2022 අප්‍රේල් 25 දින ලබාදුන් තීන්දුව අනුව සමාගම විසින් රු.375,000/- ක වන්දියක් ගෙවිය යුතු විය.

(8) 2022 මාර්තු මාසය සඳහා වන ස්ථාවර තැන්පතු මත පොලී ආදායම වන රු.250,000/-, 2022 අප්‍රේල් 02 දින ලැබී ඇත.

(9) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය 2022 මැයි 31 දින ලබා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ජැක්සන් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 09)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(c) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 02)

(d) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

2022 මාර්තු 31 දිනෙන් සහ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වන පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන **සීමාසහිත කේසත් සමාගමේ** පොත්වලින් උපුටාගෙන ඇත:

**සීමාසහිත කේසත් සමාගම**
**2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයන්**

| | **රු.'000** |
|---|---|
| විකුණුම් | 76,000 |
| විකුණුම් පිරිවැය | (49,400) |
| දළ ලාභය | 26,600 |
| පොලී සහ බදුවලට පෙර ලාභය | 11,000 |
| පොලී වියදම | (2,600) |
| බදු පෙර ලාභය | 8,400 |
| බදු පසු ලාභය | 7,140 |

**සීමාසහිත කේසත් සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | **2022 මාර්තු 31 දිනට** | | **2021 මාර්තු 31 දිනට** | |
|---|---|---|---|---|
| **වත්කම්:** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | | 140,000 | | 132,000 |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 41,000 | | 40,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 27,000 | | 22,000 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 7,200 | 75,200 | 6,400 | 68,400 |
| **මුළු වත්කම්** | | **215,200** | | **200,400** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 100,000 | | 100,000 |
| රඳවාගත් ඉපැයීම් | | 45,000 | | 37,860 |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| දිගුකාලීන ණය | | 18,000 | | 24,000 |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 35,700 | | 27,000 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 4,500 | | 5,500 | |
| උපචිත වියදම් | 12,000 | 52,200 | 6,040 | 38,540 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **215,200** | | **200,400** |

සියලුම විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත කේසත් සමාගමේ** පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

| | | | |
|---|---|---|---|
| (i) | දළ ලාභ අනුපාතය. | (v) | ණයහිමි ගෙවීම් කාලය. |
| (ii) | ජංගම අනුපාතය. | (vi) | තෝලන අනුපාතය. |
| (iii) | ණයගැති එකතුකිරීමේ කාලය. | (vii) | පොළී ආවරණය. |
| (iv) | තොග රඳවා ගැනීමේ කාලය. | (viii) | වත්කම් පිරිවැටුම් අනුපාතය. (ලකුණු 08) |

(b) **සීමාසහිත කේසත් සමාගමේ** පහත සඳහන් අනුපාත වැඩි දියුණු කරගත හැකි ආකාර දෙකක්(02) **සඳහන් කරන්න**:

| | | | |
|---|---|---|---|
| (i) | දළ ලාභ අනුපාතය. | (ii) | තොග රඳවාගැනීමේ කාලය (ලකුණු 04) |

(මුළු ලකුණු 12)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත ඇස්ට්‍රෝ සමාගමේ (AL)** සහ **සීමාසහිත බෙස්ට්‍රෝ සමාගමේ (BL)** 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ පහත සඳහන් පරිදි වේ:

**2022 මාර්තු 31 දිනට**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශ** *(රු.'000)*

| | AL | BL |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 50,000 | 15,000 |
| සමුච්චිත ක්ෂයවීම් | (15,400) | (3,750) |
| ධාරණ අගය | 34,600 | 11,250 |
| BL හි කළ ආයෝජනය | 50,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 12,300 | 15,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 30,200 | 10,900 |
| AL ගෙන් ලැබිය යුතු මුදල් | - | 2,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,750 | 1,550 |
| **මුළු වත්කම්** | **129,850** | **40,700** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 60,000 | 25,000 |
| රඳවාගත් ඉපැයීම් | 27,800 | 9,900 |
| | **87,800** | **34,900** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 16,000 | - |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 20,350 | 5,140 |
| BL ට ගෙවිය යුතු මුදල් | 2,000 | - |
| බැංකු අයිරාව | 3,700 | 660 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **129,850** | **40,700** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 අප්‍රේල් 01 දින **BL** හි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් **AL** විසින් අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගත් දිනට පාලනය නොවන හිමිකමෙහි සාධාරණ වටිනාකම රු.6,000,000/- ක් වූ අතර, **BL** හි හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය ඒවායේ පොත් අගයට සමාන විය. අත්පත් කරගත් දිනට, **BL** හි රඳවාගත් ඉපැයීම් රු.7,000,000/- ක් විය.

(2) වර්ෂය තුළදී, 25% ක අධිකයක් (mark-up) සහිතව **BL** විසින් **AL** ට භාණ්ඩ විකුණා ඇත. 2022 මාර්තු 31 දිනට, **BL** ගෙන් මිලට ගත් රු. මිලියන 3.5 ක් වටිනා නොවිකුණු තොග **AL** හි තොගයෙහි අන්තර්ගත විය. තවද, මෙම ගනුදෙනුව මත ගෙවිය යුතු රු. මිලියන 2 ක්, 2022 මාර්තු 31 දිනට **BL** හි ලැබිය යුතු මුදල් තුළ හා **AL** හි ගෙවිය යුතු මුදල් තුළ අන්තර්ගත විය.

(3) වර්ෂය තුළදී, **BL** විසින් මිලට ගන්නා ලද රු. මිලියන 5 ක් වටිනා ඉඩමක් **AL** වෙත රු. මිලියන 10 කට විකුණා ඇත.

(4) 2022 මාර්තු 31 දින කීර්තිනාමය මත හානිකරණ සමාලෝචනයක් පැවැත්වූ අතර, කීර්තිනාමය රු.300,000/- කින් හානිකරණය වී ඇතැයි එහිදී අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) 2022 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

(මුළු ලකුණු 13)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු  කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |